**රත්මලාන/ මොරටුව සහ ජා ඇල / ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතිය - 2012**

---

## 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර,මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) නිශ්චිත ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව , සහ

(ඉ) නිශ්චිත ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.2,108,357,551 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.12,590,791,893 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| කෙරීගෙනයන වැඩ | 2,108,208,551 | 2,887,743,493 | 12,473,409,298 |
| දේපල , පිරියත හා උපකරණ | 149,000 | 3,312,011 | 117,382,595 |
| එකතුව | 2,108,357,551 | 2,891,055,504 | 12,590,791,893 |

## 3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් රු.20,279,900 ක පිරිවැයකට පොම්ප කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අත්කරගන්නා ලද ඉඩමක් හා රු.28,234,000 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 07 ක් මූල්‍ය ප්‍රකාශනවල අදාළ නොවන පරිදි කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ආ) විදේශ විනිමය හුවමාරු වෙනස වූ රු.126,965,293 ක් විදේශ ප්‍රදාන ගිණුම වෙනුවට කෙරීගෙන වැඩ ගිණුමට බැර කර තිබුණි.

## 4. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 4.1 අරමුදල් උපයෝජනය

---------------------------

මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ .

| ප්‍රභවය | නිශ්චිත ගිවිසුමේ සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2012 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා නියෝජිතායතනය -ණය | 91.92 | 10,495 | 1,350 | 1,137 | 78.36 | 8,549 |
| - ප්‍රදාන | 5.98 | 683 | 150 | 205 | 5.31 | 624 |
| ශ්‍රී ලංකා රජය | 44.86 | 5,122 | 1,082 | 653 | 25.69 | 3,028 |
| එකතුව | 142.76 | 16,300 | 2,582 | 1,995 | 109.36 | 12,201* |

* සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් සහ ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දැක්වෙන මුදලින් මෙම මුදල වෙනස් වේ.

ව්‍යාපෘති කාල පරිච්ඡේදයේ සාර්ථකව ක්‍රියාත්මක වීම තහවුරු කර ගැනීම සඳහා මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්කයන් මතු කර දක්වමින් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක සැලැස්මක් හා ක්‍රියාකාරී

සැලසුම් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එවැනි සැලැසුම් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2 භෞතික කාර්යසාධනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් වර්ෂ 5 ක් ගතවීමෙන් පසුවත් පිළිවෙලින් සියයට 85.04 ක් හා සියයට 77.9 ක් ලෙස පැවතුණි.

(ආ) පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ සංරචකය යටතේ වූ කාර්යයන් ලෝක බැංකුව සඳහා පත්කරන ලද උපදේශක විසින් සනීපාරක්ෂක ක්‍රමවේදයේ යෝග්‍යතාවය පිළිබඳ ඇගයීම් වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කිරීමේ සිට වර්ෂ 5 ක් ගතවීමෙන් පසුවත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) නිශ්චිත ගිවිසුමේ 1 ඡේදය අනුව, ජාඇල / ඒකල අප ජලය පාලන පිරිසිදු කිරීමේ පිරියතට අදාළව පරිසරයට හෝ මහජනතාවට හානියක් නොවන අයුරින් පිරිසිදු කළ ජලය හා අපද්‍රව්‍ය අපහරණය කළ යුතුය. කෙසේ වුවද එවැනි ක්‍රමයක් 2014 සැප්තැම්බර් 24 විගණන පරීක්ෂණ දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ලැබුණු තොරතුරු අනුව, ජා ඇල හා රත්මලාන ප්‍රදේශවල මලාපවහන පද්ධති සඳහා එළන ලද පොලි එතිලින් නළ (Corrugated Poly Ethylene Pipes) දෝෂ සහිත බව ව්‍යාපෘතිය විසින් හඳුනා ගෙන තිබූ අතර PPE පයිප්ප (Plain Poly Ethylene Pipes) යොදා ගනිමින් එම නළ ආදේශ කළ යුතු බවට කොන්ත්‍රාත්කරු උපදෙස් දී තිබුණි. 2014 සැප්තැම්බර් 24 කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ දිනය වන විට මුළු දිග මීටර් 10,833 කින් මීටර් 9,300 ක දිග ප්‍රමාණයකට පමණක් නළ එළා තිබුණි.

**4.3 මූල්‍ය පාලන පිළිබඳ කරුණු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ගනුදෙනු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනය සඳහා භාජනය කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ දේපල, පිරියත හා උපකරණවල භෞතික පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන කරුණු**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබූ නමුත් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ

පාරිශ්‍රමික වල පිරිවැයෙන් සියයට 20 ක් නියෝජනය වන රු. 37,581,520 ක මුදලක් පොදුකාර්ය පිරිවැය ලෙස ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ආ) උපදේශක සේවා වියදම් දැරීම සඳහා 2012 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රදාන යටතේ රු. මිලියන 150 ක් වූ වෙන් කිරීමක් කර තිබුණි. කෙසේ වුවද අදාළ පාර්ශ්වයන්ගෙන් අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 205 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) උප කොන්ත්‍රාත්කරුට කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් ලියකියවිලි පරීක්ෂා කිරීම හා ඒ පිළිබඳ ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කිරීම පරීක්ෂා කිරීම සඳහා පොදු කාර්ය පිරිවැය ලෙස ව්‍යාපෘතිය විසින් රු.5,189,064 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඈ) අරමුදල් උපයෝජනයට අදාළව තොරතුරු ව්‍යාපෘතිය විසින් රේඛීය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ වාර්තා සමඟ සසඳා නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතිය විසින් ප්‍රදාන මුදල් වලින් සමාලෝචිත වර්ෂය තුළ කරන ලද රු. මිලියන 205.42 කට සමාන එ ජ ඩො මිලියන 1.6 ක ඍජු ගෙවීම් රේඛීය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය විසින් වාර්තා කර නොතිබූ බව හෙළිදරව් විය.

(ඉ) 2010 වර්ෂයේදී රු.මිලියන 62.80 ක පිරිවැයකට ''සුමිත මිතුදම්පුර'' මලාපවහන පිරියතට යාබද ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම අත්පත් කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග වර්ෂ 1 ½ ට වැඩි කාලයක් ප්‍රමාද වී තිබූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම් වටිනාකම ඉහළ යාම හේතුවෙන් රු. මිලියන 13.27 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබූ බවත් නිරීක්ෂණය විය.

**4.5 පරිබාහිර වියදම්**

------------------

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඍජුවම අදාළ නොවූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පුස්තකාල පොත් හා ලැප්ටොප් පරිගණක ප්‍රසම්පාදනය කිරීම, ටෙලි චිත්‍රපට නිෂ්පාදනය කිරීම හා විවෘත කිරීමේ උත්සවයට පිරිවැය දැරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද දායකයෙන් රු.2,718,536 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබූ බව නිරීක්ෂණය විය.